# කාර්යසාධන වාර්තාව

# 2025

# ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය


**නව මහ ලේකම් කාර්යාලය, මාළිගාවත්ත,**

**කොළඹ -10**

දුරකථන : 011-2446183 – 4 / ෆැක්ස් : 011-2541184

වෙබ් : www.fisheries.gov.lk

විද්‍යුත් ලිපිනය : secfisherieslk@gmail.com

## 2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

## ආයතනයේ නම - ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

## වැය ශීර්ෂ අංකය - 151

**අන්තර්ගතය** **පිටු අංකය**


| | | | |
|---|---|---|---|
| පරිච්ඡේදය 01 | - | ආයතනික පැතිකඩ | 03 |
| පරිච්ඡේදය 02 | - | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 09 |
| පරිච්ඡේදය 03 | - | වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය | 11 |
| පරිච්ඡේදය 04 | - | කාර්යසාධන දර්ශක | 19 |
| පරිච්ඡේදය 05 | - | තිරසර සංවර්ධන අරමුණු (SDG)සපුරා ගැනීමේ කාර්යසාධනය | 19 |
| පරිච්ඡේදය 06 | - | මානව සම්පත් පැතිකඩ | 22 |
| පරිච්ඡේදය 07 | - | අනුකූලතා වාර්තාව | 24 |

# 01 - ආයතනික පැතිකඩ

## 1.1. හැඳින්වීම

ජාතික ප්‍රතිපත්තියට ආගන්තුක නොවූ සංවර්ධන සැලසුම් විසින් ගොඩනගන ප්‍රගතිය, රාජ්‍යක ඉදිරි පියවර සාර්ථකත්වයෙහිලා කරන බලපෑම සුළුපටු නොවේ. රජයක් මානව, භෞතික සහ මූල්‍ය සම්පත් යොදවනුයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක ප්‍රගතිය අපේක්ෂාවෙනි.

සැලකිය යුතු විභවයක් සහිත ධීවර, ජලජ හා සාගර සම්පත් තිරසර ලෙස යොදා ගනුවස් ජාතික අභිලාස සපුරා ගැනීමට පසුගිය වසරේද රජය විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබේ.

ශ්‍රී ලංකාවේ ධීවර සම්පත් පදනමවන වර්ග කිලෝමීටර් 517,000ක අනන්‍ය ආර්ථික කලාපයක්, වර්ග කිලෝ මීටර් 21,500ක දේශීය ජල තීරයක්, වර්ග කිලෝ මීටර් 1,580ක කලපු හා ගං මෝයවල් පරිසරයක්, වර්ග කිලෝ මීටර් 2,600ක මිනිසා විසින් සාදන ලද ජලාශ පද්ධතියක් ඊට අයත් වේ. බොකු, කලපු, ජලාශ සහ වෙරළබඩ මෙන් ම ජලාශ ආශ්‍රිතව පිහිටා ඇති ඉඩම් ද ජලජීවිවගා සංවර්ධනය සඳහා අවශ්‍ය සම්පත් පදනම උපයෝජනයට ඉඩසලසන ස්වභාවික සම්පත්ය.

ධීවර අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛනවලට අනුව මෙරට ධීවරයින් සංඛ්‍යාව 318,470කි. එයින් 223,720ක් කරදිය ධීවර අංශයේ රැකියාවේ නියුක්ත වී සිටිති. 85% ක් පමණ වන පිරිස වෙරළාසන්න ධීවරයින් වන අතර 34,550ක් බහු දින ධීවර යාත්‍රා ආශ්‍රයෙන් අක්වෙරළ හා ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයෙහි නිරත වේ. මෙරට ධීවර කර්මාන්තයේ ප්‍රධානතම සම්පතක් වන ධීවර කාර්මික පවුල් සංඛ්‍යාව 273,240ක් වන අතර ධීවර කර්මාන්තයෙන් සෘජුවම යැපෙන්නන් සංඛ්‍යාව 1,123,000කි. ධීවර කර්මාන්තය හා ආශ්‍රිත වෙනත් යැපීම් සලසා ගන්නා පිරිස මිලියන 2.7 ක් යැයි ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 18% ක් පමණ ධීවර කර්මාන්තය ආශ්‍රිතව ජීවනෝපාය සලසා ගනිති. එය සමස්ත ජනගහනයෙන් පහෙන් එකකට ආසන්න සැළකිය යුතු ප්‍රමාණයකි.

2025 වසරේදී කරදිය ධීවර කර්මාන්තයෙන් මත්ස්‍ය අස්වනු මෙ.ටො. 308,205ක් හා මිරිදිය ධීවර කර්මාන්තයෙන් මෙ.ටො.55,985ක මත්ස්‍ය අස්වැන්නක් නෙළා ගෙන තිබේ. එය සමස්තයක් ලෙස මෙ.ටො. 364,190කි.

මහජනතාවගේ සත්ව ප්‍රෝටීන අවශ්‍යතාවේ ප්‍රධාන ප්‍රභවය ලෙස මත්ස්‍ය සම්පත් ප්‍රචලිතය. උක්ත කාලය තුලදී ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 33.9ක් ලෙස වාර්තාවීමෙන් එය තහවුරුවේ.

2025 වර්ෂය තුලදී මත්ස්‍ය අපනයනවල වටිනාකම රු.මි 92,739 කි. (ඇ.ඩො.මි. 307.9) ජාතික අපනයන ආදායමට ධීවර අංශයේ දායකත්වය 2.4 % ක් පමණ වේ. අපනයන දත්තවලට අනුව, ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදනවලින් 45.6% ක් යුරෝපය වෙත අපනයනය කරන අතර ඉන් 31.6% ක් යුරෝපා සංගමය වෙත ද, ඉතිරි 14.0% ක් යුරෝපා සංගමය නොවන රටවල් වෙත ද අපනයනය කරයි. එමෙන්ම, උක්ත කාල පරිච්ඡේදයේදී විසිතුරු මසුන් අපනයනයෙන් උපයා ගත් ආදායම රු.මි. 6,802.7ක් බව සංඛ්‍යා ලේඛන පෙන්වා දෙයි.

නිසි විද්‍යාත්මක ක්‍රමවේද හා ප්‍රායෝගික උපක්‍රම උපයෝගී කරගනිමින් තිරසර හා පරිසර හිතකාමී ලෙස සංවර්ධනය හා කළමනාකරණය කිරීමටත්, එමගින් මත්ස්‍ය නිෂ්පාදන සුලභ කිරීම හා පාරිභෝගිකයාට සාධාරණ මිලකට ලබාගත හැකි තත්ත්වයකට පත් කිරීමත්, කර්මාන්තයේ නියැලෙන්නන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමත් අරමුණු කොට තව දුරටත් රජය ‘පොහොසත් රටක් ලස්සන ජීවිතයක්’ ප්‍රතිපත්ති රාමුවේ තිරසර කළමනාකරණයක් - ගුණාත්මක මත්ස්‍ය සම්පතක් ප්‍රධාන ප්‍රතිපත්තියක් ලෙස දක්වා ඇති අතර ඒ අනුව වැඩසටහන්/ව්‍යාපෘති ධීවර කර්මාන්තය නංවාලීම සඳහා 2026 වසර තුල ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

ධීවර හා ජලජ සම්පත් සංරක්ෂණය සහ තිරසාර භාවිතය පිළිබඳ දකුණු ආසියානු කලාපයේ ප්‍රමුඛයාවීම

**මෙහෙවර**

වර්තමාන හා අනාගත පරපුරේ යහපත උදෙසා ධීවර හා ජලජ සම්පත් භාවිතය කලමනාකරණය කිරීම.

**ප්‍රතිපත්තිමය අරමුණු**

- විද්‍යානුකූල පදනමකින් යුත් (science based) තොරතුරු භාවිතා කරමින් සම්පත් තිරසාර ලෙස කලමනාකරණය කිරීම.
- ධීවර කර්මාන්තය කලාපීය හා ජාත්‍යන්තර බැඳීම් වලට අනුකූල වීම.
- සමුද්‍රීය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම
- ජලජීවීවගා සහ මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.
- පසු අස්වනු හානි අවම කිරීම සහ අගය එකතු කිරීම ඉහළ නැංවීම.
- ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම.
- අපනයන ආදායම් ඉහළ නැංවීම.
- විනෝදාත්මක ක්‍රියාකාරකම්, රැකියා හා ව්‍යාපාරික සංවර්ධනය සඳහා පවතින අවස්ථා ඉහළ නැංවීම.
- ධීවර ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම.


## 1.3. ප්‍රධාන කාර්යයන්

**අංක 2412/08 හා 2024.11.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පවරා ඇති විෂයයන් හා කාර්යයන්**

1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ධීවර, ජලජ හා සාගර සම්පත් විෂයයන්ට සහ අදාලව අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
4. ජාතික ජලජ සම්පත් සංවර්ධන හා පර්යේෂණ නියෝජිතායතනයේ පර්යේෂණ සහ සංවර්වධන අවස්ථා පුළුල් කිරීම
5. ජාත්‍යන්තර සම්මුතීන්, ගිවිසුම් සහ ප්‍රමිතීන්ට අනුකූලව ධීවර කර්මාන්තයට බාධාවක් වන නීති රෙගුලාසි සහ ක්‍රියා පිළිවෙත් සංශෝධනය කිරීම
6. ධීවර හා ජලජීවී වගා කටයුතු කළමනාකරණය කිරීම සඳහා උපදේශන සභාවක් පිහිටුවීම
7. නීති විරෝධී ධීවර කටයුතු අධෛර්යමත් කිරීම, සාගර දූෂණය අවම කිරීම සහ හදිසි අවස්ථාවන්හි දී කඩිනම් ප්‍රතිචාර දැක්වීම හා සාගර ආපදා අවම කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම
8. නිල් ආර්ථික ප්‍රවේශයක් තුළින් සාගර සම්පත් වල තිරසාර භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ නවීන සාගර කර්මාන්තයන් ස්ථාපිත කිරීම

9. විවිධ උෂ්ණත්වයන් යටතේ හා විවිධ ගැඹුරු මට්ටම්වල දී මත්ස්‍ය සම්පත නෙලා ගැනීමට ධීවර ප්‍රජාව වෙත තාක්ෂණික සහාය ලබා දීම
10. ධීවර වරායන් සහ දැල් තොටමුණ ඇතුළු පාරම්පරික ධීවර බිම්වල හිමිකාරිත්වය සහ ප්‍රවේශය සහතික කිරීම සහ එම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.
11. සාගර ධීවර කර්මාන්තය නැවත පණ ගැන්වීම සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය සැපයීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම සහ නිෂ්පාදන පිරිවැය අඩු කර බිඳ වැටී ඇති ධීවර කර්මාන්තය නඟා සිටුවීම සඳහා ඉන්ධන සහනාධාරය ලබාදීම
12. නව, පරිසර හිතකාමී මෙන්ම ඵලදායී ධීවර තාක්ෂණයන් හඳුන්වා දීම
13. ධීවර යාත්‍රා කාර්ය මණ්ඩල සහ ධීවර යාත්‍රාවන් විදේශ මුහුදු ප්‍රදේශවල දී ගැටලු වලට මුහුණ දෙන හදිසි අවස්ථා වලදී කාර්යක්ෂම සහ විධිමත් රාජ්‍යතාන්ත්‍රික මැදිහත්වීම් සිදු කරන බව සහතික කිරීම
14. මත්ස්‍ය නිෂ්පාදන සඳහා විදේශ වෙළඳපොළ තුළ ඉහළ වටිනාකමක් ලබා ගැනීමට සහ වෙළඳපොළ කොටස වැඩිකර ගැනීමේ ක්‍රියාමාර්ග හඳුන්වා දීම
15. ඉහළ ඉල්ලුමක් සහිත හා අවම පරිභෝජනයකින් යුත් මුහුදු පැලෑටි නිෂ්පාදනය විවිධාංගීකරණය කිරීම සඳහා තාක්ෂණික සහාය ලබා දීමට කටයුතු සැලසීම සහ එකී නිෂ්පාදන සඳහා වෙළඳපොළ සොයා ගැනීම පිණිස මැදිහත් වීම
16. අභ්‍යන්තර ජල මූලාශ්‍ර ජාලය උපයෝගී කර ගනිමින් මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ ව්‍යාප්ත කිරීම
17. වාණිජ අරමුණෙන් මිරිදිය මත්ස්‍ය අස්වනු ලබාගැනීම උදෙසා නවීන තාක්ෂණයෙන් යුත් විශාල පරිමාණයේ ගොවිපළවල් පිහිටුවීමට ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහා මූල්‍ය සහාය සැපයීම
18. විසිතුරු මත්ස්‍යයන් හා ජලජ ශාක නිෂ්පාදනය හා අපනයනය ප්‍රවර්ධනය කිරීම
19. විසිතුරු ජලජ ශාක නිෂ්පාදන ක්‍රම සඳහා තාක්ෂණික සහ මූල්‍ය සහාය ලබාදීමට කටයුතු සැලසීම
20. ධීවර යාත්‍රා කළමනාකරණය සහ මෙහෙයවීම
21. පාරිභෝගිකයාට සහ නිෂ්පාදකයාට සාධාරණයක් වන පරිදි මත්ස්‍ය නිෂ්පාදන අලෙවි කටයුතු පුළුල් කිරීම
22. අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම්වලට අවස්ථාව ලබාදීම
23. දේශීය ටින් මාළු කර්මාන්තය පුළුල් කිරීම සඳහා කටයුතු කිරීම
24. ධීවර කර්මාන්තය ආශ්‍රිතව ව්‍යවසායකත්වය ප්‍රර්වධනය කිරීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දිරිමත් කිරීම
25. ධීවර ප්‍රජාවගේ සුභසාධන කටයුතු පුළුල් කිරීම හා ඵලදායි බැංකු සහ රක්ෂණ ක්‍රම හා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම හඳුන්වාදීම
26. සාගර විශ්ව විද්‍යාලය හා සම්බන්ධ වී ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනා කරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
27. සමුද්‍ර, කිවුල් දිය (කලපු) හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංර්වධනය හා කළමනාකරණය
28. බහු දින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කර ශීතකරණ පද්ධති සංර්වධනය කිරීම සහ සූර්ය බලශක්තිය භාවිතය දිරිමත් කිරීම
29. ධීවර වරායවල් සහ නැංගුරම් පොලවල් පිහිටුවීම, නඩත්තුව සහ කළමනාකරණය
30. ධීවර කර්කමාන්තය වෙනුවෙන් අවශ්‍ය වන අයිස් යන්ත්‍රාගාර, ශීත කාමර සහ යටිතල පහසුකම් දියුණු කිරීම හා නඩත්තු කටයුතු
31. මාළු හා මාළු ආශ්‍රිත නිෂ්පාදන වෙළඳාම හා බෙදාහැරීම
32. ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශට අනුබද්ධ ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
33. ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශට අනුබද්ධ ආයතනයන් අධීක්ෂණය කිරීම

## 1.4. සංවිධාන සටහන



## 1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

I. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව(DFAR)

## 1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන / අරමුදල්

I. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය(NARA)
II. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය(NAQDA)
III. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව(CFHC)
IV. ලංකා ධීවර සංස්ථාව(CFC)
V. සීමාසහිත සීනෝර් පදනම (Cey-nor)
VI. නෝත් සී ලිමිටඩ (North sea Ltd)
VII. පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණය

## 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

| ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යෝජනා | | |
|---|---|---|
| **ව්‍යාපෘති යෝජනාව** | **රු.මි.** | **වර්ථමාන ප්‍රගතිය** |
| ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාවන්හි ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීම් සහතික කිරීම සඳහා වගා පාදක මිරිදිය ධීවර කර්මාන්තය ස්වයං තිරසාර ලෙස සංවර්ධනය කිරීම | 900.0 | ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව ඉහළ නැංවීම සඳහා මත්ස්‍ය බීජ අභිජනන ධාරිතාවය වැඩිදියුණු කරන ලදී. මේ යටතේ<br>1. මඩකලපුව දිස්ත්‍රික්කයේ පුළුකුණාව, මොණරාගල දිස්ත්‍රික්කයේ මුතුකණ්ඩිය සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය යන ප්‍රදේශවල ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය අභිජනනාගාර 03ක් ඉදිකරන ලදි.<br>2. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සතු ජලජීවී වගා මධ්‍යස්ථාන 04ක් (ඉඟිනියාගල, ඉරණමඩු, උඩවලව හා දඹුල්ල) වැඩිදියුණු කිරීම සිදුකරන ලදී.<br>3. එක්කල්ඔය ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය අභිජනන ඒකක වල පහසුකම් වැඩිදියුණු කිරීම සිදුකරන ලදී.<br>4. අධිකාරිය සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රවාහනය කරන බවුසර් රථ 03ක් ලබාදෙන ලදී |
| අම්පාර දිස්ත්‍රික්කයේ ස්වයං තිරසාර වගා පාදක මිරිදිය ධීවර පොකුණු ආකෘතියක් ස්ථාපිත කිරීම සඳහා තාක්ෂණික සහාය | 43.8 | අම්පාර දිස්ත්‍රික්කයේ කුඩා පරිමාණ මත්ස්‍ය අභිජනන ඒකක සහ කුඩා පරිමාණ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක සංවර්ධනය කරන ලදී. ජලාශවලින් මවු මසුන් එකතුකිරීම, ධීවර ප්‍රජාව සඳහා පොත් තැබීම සහ වාර්තා තබා ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම, ධීවර කළමනාකරණ පුහුණු වැඩසටහන් පැවැත්වීම, මත්ස්‍ය ආහාර සැපයීම සහ කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම සිදු කර ඇත. |

| ජපන් රජයේ (ජපන් ජාත්‍යන්තර සහයෝගිතා පද්ධතිය - Japan International Cooperation System - JICS) ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යෝජනා | | |
|---|---|---|
| ව්‍යාපෘති යෝජනාව | මුදල (ඇ.ඩො.මි) | වර්ථමාන ප්‍රගතිය |
| උතුරු හා නැගෙනහිර පළාත්වල ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම. | 3 | අංක NPD/AGC/PP/FIS/2023/05 යටතේ 2023.07.04 දිනැති ලිපිය මගින් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ (NPD) අනුමැතිය ලැබී ඇත.<br>අදියර 2ක් යටතේ උපකරණ ලබා දීමට නියමිතය. පළමු අදියර යටතේ ධීවර කටයුතු ප්‍රවර්ධනය සහ ශීත කටයුතු වලට අදාළ ව පහත උපකරණ ලබාදීම සිදුකරනු ලබයි.<br>- Ice Making Machine<br>- Prefabricated Refrigerator/ Freezer<br>දෙවන අදියර යටතේ ධීවරයින්ගේ ආරක්ෂාවට අදාළව පහත උපකරණ ලබාදීමට නියමිතය.<br>- Patrol Boat<br>- Rigid Hull Inflatable Boat (RIB)<br>- HF Radio Transceiver |

# 02 - ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

## ජයග්‍රහණ

- උතුරු පළාත තුළ 2024 වර්ෂයේ අයවැය මගින් රු. මිලියන 500ක ප්‍රමාණයක් වෙන් කරවාගෙන ඉන් 2025 වර්ෂය සඳහා රු.මි. 280ක ප්‍රතිපාදන මගින් මන්නාරම, මුලතිව්, කිලිනොච්චි හා යාපනය දිස්ත්‍රික්කයන්හි ධීවර තොටුපොළ 62ක් ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති අවසන් කිරීම.
- ධීවර කටයුතුවලට පමණක් සීමා කොට තිබූ ගන්දර ධීවර වරාය ව්‍යාපෘතිය සංචාරක, ධීවර, සමාජ සංවර්ධන ආදී බහුවිධ ක්ෂේත්‍රන්හි ප්‍රතිලාභ අත්පත් කරගත හැකි ධීවර වරායක් බවට පත් කිරීම සඳහා කටයුතු කිරීම.
- ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය විසින් කොග්ගල, රැකව, ආරුගම්බේ, මඩකලපුව සහ චුන්ඩිකුලම් කලපු තුළ මිරිදිය ඉස්සන් පසු කීටයන් (Post-Larvae) මිලියන 5කට අධික ප්‍රමාණයක් තැන්පත් කිරීමට කටයුතු කිරීම.
- ජාතික ධීවර සම්මේලනයට අදාලව මෙතෙක් කල් සැදීමට ප්‍රමාද වී තිබූ රෙගුලාසි සකස් කර අනුමැතිය සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම
- වර්තමානයේදී ධීවර කර්මාන්තය හා ජලජීවී වගාව මුහුණ දෙමින් සිටින අභියෝග හඳුනා ගැනීම හා විසඳුම් ලබා දීම සඳහා දිස්ත්‍රික්ක 19ක දිස්ත්‍රික් ධීවර සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම
- මයිලිඩ්ඩි ධීවර වරාය අදියර II 2025 පළමු කාර්තුව තුළ වැඩ අවසන් කිරීම
- කතළුව, කයිකාවල දියකඩන ඉදිකිරීමට අදාලවන ශක්‍යතා අධ්‍යයනය කිරීම සඳහා උපදේශන ආයතන වෙත ප්‍රදානය කිරීම

## අභියෝග

- විවිධ භෞතික සාධක හේතුවෙන් අක්‍රිය තත්ත්වයේ පවතින ඔලුවිල් ධීවර වරාය ජාතික ආර්ථිකයට දායක කරගත හැකි පරිදි සක්‍රිය මට්ටමකට ගෙන ඒම.
- ඔලුවිල් ධීවර වරායේ මත්ස්‍ය සැකසුම් මධ්‍යස්ථානය මෙතෙක් ආරම්භ කිරීමට නොහැකි වීම හා මේ සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ආයෝජන අවස්ථා හඳුනාගැනීමට කටයුතු කිරීම.
- ධීවර වරායන්හි දියකඩන හේතුවෙන් එක් රැස්වන වැලි නිධි ඉවත් කිරීම ඉතා මිල අධික හා දුෂ්කර කටයුත්තක් වීම .
- ජලජීවී වගාව ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය වගා බිම් ප්‍රමාණවත් නොවීම හා වගා බිම් පවරා ගැනීමට අරමුදල් සපයා ගැනීමේ දුෂ්කරතා.
- ජලජීවී වගාව සඳහා ප්‍රශස්ථ ඉඩම් වෙනත් කටයුතු සඳහා යොදවා ගැනීම.
- ධීවර ක්ෂේත්‍රට අදාළ පාරිසරික අනුමැතීන් ලබා ගැනීම්, ලියාපදිංචි කිරීම් සහ බලපත්‍ර ලබා ගැනීම් සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් නොමැති වීමෙන් විවිධ ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කිරීම ප්‍රමාද වීම.

**ඉලක්ක**

- දැනට ඉදි කෙරෙමින් පවතින ගන්දර ධීවර වරායේ ඉදි කිරීම් කටයුතු අවසන් කර 2026 වසර තුල එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම. එමඟින් ජාත්‍යන්තර බෝට්ටු, සංචාරක කර්මාන්තය හා ඒකාබද්ධ වැඩසටහන් සඳහා අවස්ථාව ලබා දීමෙන් විදේශ විනිමය ඉපැයීමේ ක්‍රමවේද ජනප්‍රිය කිරීම.
- උතුරු පළාත තුළ ධීවර ක්ෂේත්‍රයේ උන්නතියට සුවිශේෂ බලපෑමක් සිදුකළ හැකි මයිලිඩ්ඩි ධීවර වරාය ඉදි කිරීම් කටයුතු වල III වන අදියර 2026 වසර වන විට අංග සම්පූර්ණ ධීවර වරායක් ලෙස වැඩි දියුණු කිරීම.
- නව ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය 2026 වර්ෂය තුළ ක්‍රියාවට නැංවීම.
- ධීවර ක්ෂේත්‍රය තුළට වැඩි වශයෙන් රාජ්‍ය-පෞද්ගලික-මහජන හවුල්කාරිත්වය ලබා ගනිමින් සංවර්ධන කටයුතු සිදු කිරීම.
- සමාජ ආරක්ෂණ ක්‍රමවේද හරහා ධීවර කාන්තාවන් දේශීය ආර්ථිකයට හා විදේශීය නිෂ්පාදන සඳහා දිරි ගන්වමින් නව ධීවර සංස්කෘතියක් රට තුළ ඇති කිරීම.
- පසු අස්වනු හානිය අවම කිරීම තුළින් ජීවනෝපාය වැඩි කිරීම සඳහා කුඩා පරිමාණ ගොඩ බෑමේ ස්ථාන සඳහා යටිතල පහසුකම් සැපයීමට කටයුතු කිරීම
- ආර්ථික ප්‍රතිලාභ උපරිම කරගත හැකි අයුරින් මෙම වසර තුළ ඔලුවිල් ධීවර වරායේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය ශක්‍යතා අධ්‍යනය සිදු කිරීම.
- වාණිජමය වශයෙන් ජලජීවී වගා (මුහුදු කුඩැල්ලා, කකුළුවා, බෙල්ලා, ඉස්සා, පොකිරිස්සා වැනි මුහුදු ජීවීන්) සිදු කරන පෞද්ගලික අංශයේ ධාරිතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රමවේද සකස් කිරීම.
- පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට ලබාගත හැකි ජනප්‍රියම ප්‍රෝටීන ප්‍රභවය බවට මාළු ආශ්‍රිත නිෂ්පාදන පත් කිරීම.
- විදේශීය වෙළඳපොළ සඳහා වන මත්ස්‍ය නිෂ්පාදන වල ගුණාත්මක හා ජාත්‍යන්තර ප්‍රමිතියේ නිෂ්පාදන ප්‍රමාණාත්මකව ඉහල දැමීම.
- දළ දේශීය නිෂ්පාදිතයට ධීවර ක්ෂේත්‍රයේ සිදු කරන දායකත්වය ඉහළ නැංවීමට සහ මත්ස්‍ය අපනයනය හරහා ලබාගත හැකි විදේශ විනිමය ඉහළ නැංවීමට සිදු කළ යුතු සංවර්ධන කාර්යයන් සඳහා රාජ්‍ය-පුද්ගලික හා මහජන දායකත්වයන් ලබා දීමට පළාත් සභා, දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශීය කාර්යාල, පළාත් පාලන ආයතන ආදී රාජ්‍ය ආයතනවල සම්බන්ධීකරණ කටයුතු ශක්තිමත් කිරීම.
- උතුරු කලාපීය ධීවර කර්මාන්ත සංවර්ධනය අදියර II යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති 2026 වර්ෂයේ අවසන් කිරීම
- Clean Sri Lanka වැඩසටහනට සමගාමීව දිවයින වටා පිහිටි ධීවර වරායන් පිරිසිදු හා නීල වරායන් (Blue Ports) බවට පරිවර්තනය කිරීමට වැඩසටහන් හඳුන්වා දී ධීවර ප්‍රජාව (ධීවර සමිති), පෞද්ගලික අංශය, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් ආයතන සමඟ ඒකාබද්ධ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.

# 3. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 | | සටහන | තත්‍ය 2025 | 2024 |
|---|---|---|---|---|
| රු. | | | රු. | රු. |
| - | ආදායම් ලැබීම් | | | |
| - | ආදායම් බදු | 1 | - | - |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - |
| - | ආදායම් නොවන ලැබීම් | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම (89/25) | | 2,286,598,586 | 3,878,669,000 |
| | භාණ්ඩාගාර උප අග්‍රිම (89/24) | | 792,065 | - |
| - | තැන්පතු | | 50,221,546 | 29,730,122 |
| - | අත්තිකාරම් ගිණුම් | | 12,663,597 | 11,928,780 |
| | වෙනත් ආදායම් නොවන ලැබීම් | | 20,649,867 | - |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | 1,532,319,131 |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 2,370,925,661 | 5,452,647,033 |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 2,370,925,661 | 5,452,647,033 |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | - | - |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 2,370,925,661 | 5,452,647,033 |
| | අඩු කළා : වියදම් | | | |
| | පුනරාවර්තන වියදම් | | | |
| 183,200,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 168,982,364 | 166,005,277 |
| 168,867,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 145,833,476 | 130,203,316 |
| 1,836,786,322 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,679,921,904 | 1,531,335,133 |
| - | පොළී ගෙවීම් | 8 | - | - |
| 1,110,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | 665,842 |
| 2,189,963,322 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 1,994,737,744 | 1,828,209,568 |
| | මූලධන වියදම් | | | |
| 114,200,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 34,315,357 | 22,059,985 |
| 3,586,800,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 1,786,809,700 | 3,235,219,973 |
| 1,463,350,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 892,560,889 | 467,567,966 |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - |
| 2,000,000 | හැකියා වර්ධනය | 14 | 1,812,129 | 655,711 |
| 112,185,756 | වෙනත් මූලධන වියදම් | 15 | 56,329,883 | 2,391,761,736 |
| 5,278,535,756 | මුළු මූලධන වියදම් (උ) | | 2,771,827,957 | 6,117,265,371 |
| | තැන්පතු ගෙවීම් | | 48,124,836 | 104,855,738 |
| | අත්තිකාරම් ගෙවීම් | | 11,599,687 | 10,530,295 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 59,724,523 | 115,386,033 |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 4,826,290,223 | 8,060,860,972 |
| 7,468,499,078 | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | **(2,455,364,562)** | **(2,608,213,939)** |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | (2,455,364,562) | (2,609,006,004) |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | 792,065 |
| | | | (2,455,364,562) | (2,608,213,939) |

1

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | සත්‍ය 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 5,730,842,252 | 4,230,025,299 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 19,865,327 | 20,929,237 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | **5,750,707,579** | **4,250,954,536** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (371,328,716) | (368,960,161) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 5,730,842,252 | 4,230,025,299 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 391,194,043 | 389,097,333 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | 792,065 |
| මුළු වගකීම් | | 5,750,707,579 | 4,250,954,536 |

පිටු අංක 7 සිට 40 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 41 සිට 47 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : එච්.පී. සමන් ධර්මසිරි |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2026/02/26 | දිනය : 2026/02/26 | දිනය : 2026/02/26 |
| ලේකම් (වැ.බ) ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය 02 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 | ලේකම් (වැ.බ) ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය 02 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 | ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 |

# 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2025 රු. | සංශෝධිත 2024 රු. |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | 20,649,867 | 1,532,319,131 |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 15,963,114 | 29,727,590 |
| අග්‍රිම ලැබීම් (89/25) | | 2,286,598,586 | 3,878,669,000 |
| උප අග්‍රිම ලැබීම් (89/24) | | 792,065 | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 9,517,194 | 11,398,332 |
| තැන්පතු ලැබීම් | | 50,357,513 | 29,730,122 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | | 2,383,878,339 | 5,481,844,175 |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 314,354,090 | 296,033,930 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 58,534,726 | 77,804,004 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් | | 92,375,210 | 1,714,838,107 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 66,422,072 | 43,626,087 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | - | - |
| අත්තිකාරම් ගෙවීම් | | 11,599,687 | 11,690,444 |
| තැන්පතු ගෙවීම් | | 48,260,803 | 104,855,738 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | | 591,546,587 | 2,248,848,310 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | | 1,792,331,752 | 3,232,995,865 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | | - | - |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | | |
| මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | | 1,792,331,752 | 3,232,995,865 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | | 1,792,331,752 | 3,232,995,865 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | | (1,792,331,752) | (3,232,995,865) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඈ) + (ඊ) | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | | - | - |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ) | | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | | - | - |

## 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

01.<u>පිළියෙල කිරීමේ අරමුණ</u>

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

02. <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

03. <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

04. <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

05. <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම්, එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

06. <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

07. <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

## 3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.000

| ආදයම් ක්ේතය | ආදායම් ක්ේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තු | | එකතු කරන ලද ආදායම් | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තු | අවසන් ඇස්තමේන්තු | ප්‍රමාණය (රු.) | අවසන් ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස |
| 2002-0-1-0-1 | ගොඩනැගිලි කුලී | - | - | 134 | 0% |
| 2002-02-99 | පොලිය-අනෙකුත් | 960 | 960 | 1,540 | 160% |
| 2003-02-99 | පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම්-විවිධ | 20,000 | 20,000 | 6,800 | 34% |
| 2004-01-00 | වැන්දඹු හා අනත්දරු දායක මුදල් | - | - | 7,449 | 0% |
| 2006-0-2-0-2 | අනිකුත් | 150 | 150 | 40 | 27% |

## 3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 2,022,000 | 2,189,963 | 1,994,738 | 91% |
| ප්‍රාග්ධන | 5,240,000 | 5,278,536 | 2,771,828 | 53% |

## 3.7. මුරෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.000

| අනුඅංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම සඳහා | 462 | 462 | 462 | 100% |
| 02 | අධ්‍යක්ෂ ජනරාල් , වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුව | ගන්දර ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ බලපත්‍රය අලුත් කිරීම | 75 | 75 | 75 | 100% |
| 03 | අධ්‍යක්ෂ ජනරාල් ධීවර ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | කොළඹ වරාය බටහිර සහ නැගෙනහිර පර්යන්තය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අදාලව ධීවර කර්මාන්තයට සිදු වූ බලපෑම අවම | 32,186 | 32,186 | 18,197 | 57% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | කිරීම සඳහා ධීවර කර්මාන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ලුනාව ධීවර තොටුපොල ආශ්‍රිත ඉදිරි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා | | | | |
| 04 | අධ්‍යක්ෂ ජනරාල් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | චීන සමූහාණ්ඩුව මගින් ලබා දුන් පෙරසව් නිවාස සැකසීම සඳහා | 50,000 | 50,000 | 19,700 | 39% |
| 05 | දිස්ත්‍රික් ලේකම්,හම්බන් තොට | මාවැල්ල නැංගුරම්පොල ඉදි කිරීම පිළිබඳ රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම. | 4 | 4 | 4 | 100% |
| 06 | අධ්‍යක්ෂ ජනරාල් ධීවර ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | කලපු පිරිසිදු කිරීම හා සංරක්ෂණය කිරීමේ වැඩසටහන යටතේ හලාවත කලපුවේ මායිම් කණු සිටුවීම වෙනුවෙන් ප්‍රතිපාදන ලබා දීම | 176 | 176 | | |
| 07 | අධ්‍යක්ෂ ජනරාල් ධීවර ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | කලපු පිරිසිදු කිරීම හා සංරක්ෂණය කිරීමේ වැඩසටහන යටතේ කලපු කළමනාකරණ කමිටු පිහිටුවීම හා ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා ප්‍රතිපාදන ලබා දීම. | 362 | 362 | (5,601) | 191% |
| 08 | අධ්‍යක්ෂ ජනරාල් ධීවර ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | කලපු සීමා ලකුණු කිරීම සඳහා | 2,400 | 2,400 | | |
| 09 | අධ්‍යක්ෂ ජනරාල් ධීවර ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ධීවර දෙපාර්තෙමේන්තුවේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දීම. | 247 | 247 | 245 | 99% |
| 10 | දිස්ත්‍රික් ලේකම්,යාපනය | යාපනය දිස්ත්‍රික්කයේ ධීවර ක්ෂේත්‍රයට අදාලව පැන නැගී ඇති ගැටළු හා ප්‍රගති සමාලෝචනය සිදු කිරීම සම්බන්ධ රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 30 | 30 | 30 | 100% |
| 13 | දිස්ත්‍රික් ලේකම්,කොළඹ | එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයින් සඳහා වන්දි ගෙවීම හා පරිපාලන දීමනා ගෙවීම | 9,944 | 9,944 | 9,229 | 93% |
| 14 | දිස්ත්‍රික් ලේකම්,ගම්පහ | එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයින් සඳහා වන්දි ගෙවීම හා පරිපාලන දීමනා ගෙවීම. | 4,824 | 4,824 | 4,699 | 97% |
| 15 | අධ්‍යක්ෂ ජනරාල් ධීවර ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයින් සඳහා වන්දි ගෙවීම ඇතුළු පරිපාලන කාර්යයන් කිරීම වෙනුවෙන් අදාල | 1,574 | 1,574 | 527 | 33% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | දීමනා ගෙවීම. | | | | |
| 16 | දි.ලේ,මාතලේ | දිස්ත්‍රික් ධීවර කමිටු රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 19 | 19 | 19 | 100% |
| 17 | දි.ලේ,මාතර | දිස්ත්‍රික් ධීවර කමිටු රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 21 | 21 | 21 | 100% |
| 19 | දි.ලේ,මොනරාගල | දිස්ත්‍රික් ධීවර කමිටු රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 44 | 44 | 44 | 100% |
| 20 | දි.ලේ,අනුරාධපුරය | දිස්ත්‍රික් ධීවර කමිටු රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 32 | 32 | 24 | 75% |
| 21 | දි.ලේ,පොලොන්න රුව | දිස්ත්‍රික් ධීවර කමිටු රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 25 | 25 | 23 | 92% |
| 22 | දි.ලේ,කිලිනොච්චි ය | දිස්ත්‍රික් ධීවර කමිටු රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 32 | 32 | 32 | 100% |
| 23 | දි.ලේ,හම්බන්තො ට | දිස්ත්‍රික් ධීවර කමිටු රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 38 | 38 | 38 | 100% |
| 24 | දි.ලේ,කුරුණෑගල | දිස්ත්‍රික් ධීවර කමිටු රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 42 | 42 | 37 | 98% |
| 25 | දි.ලේ,ගම්පහ | දිස්ත්‍රික් ධීවර කමිටු රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 39 | 39 | 38 | 97% |
| 26 | දි.ලේ,පුත්තලම | දිස්ත්‍රික් ධීවර කමිටු රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 22 | 22 | 21 | 95% |
| 28 | දි.ලේ,ත්‍රිකුණාමල ය | දිස්ත්‍රික් ධීවර කමිටු රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 29 | 29 | 29 | 100% |
| 29 | දි.ලේ,මන්නාරම | දිස්ත්‍රික් ධීවර කමිටු රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 33 | 33 | 33 | 100% |
| 30 | දි.ලේ,අම්පාර | දිස්ත්‍රික් ධීවර කමිටු රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 36 | 36 | 36 | 100% |
| 32 | දි.ලේ,මුලතිව් | දිස්ත්‍රික් ධීවර කමිටු රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 23 | 23 | 23 | 100% |
| 33 | දි.ලේ,මඩකලපුව | දිස්ත්‍රික් ධීවර කමිටු රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 46 | 46 | 46 | 100% |
| 34 | දි.ලේ,රත්නපුරය | දිස්ත්‍රික් ධීවර කමිටු රැස්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම | 35 | 35 | 35 | 100% |
| 16 | ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය | පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා 2025 අනුමත අයවැය ඇස්තමේන්තුවෙන් ලබා දුන් භාණ්ඩාගාර දායකත්වය හා මසුන් ඉවතට යාම වැලැක්වීම සඳහා බාධක දැල් ස්ථාපිත කිරීමේ කාර්යය සඳහා ලබා දුන් ප්‍රතිපාදන | 1,107,000 | 1,423,284 | 1,331,368 | 93% |
| 17 | ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය | පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා 2025 අනුමත අයවැය ඇස්තමේන්තුවෙන් ලබා දුන් භාණ්ඩාගාර දායකත්වය | 830,000 | 830,000 | 598,954 | 72% |
| 18 | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා 2025 අනුමත අයවැය ඇස්තමේන්තුවෙන් ලබා දුන් භාණ්ඩාගාර දායකත්වය හා ඩ්‍රෙජරය මිලදී ගැනීම සඳහා ලබා දුන් ප්‍රතිපාදන | 350,000 | 758,000 | 530,581 | 70% |

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.000

| වත්කම් කේතය | කේත විස්තරය | 2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2025.12.31 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | 4,221,113 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 350,623 | | |
| 9153 | ඉඩම් | | 972,685 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | - | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | 186,421 | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | - | | |

### 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම I

# 4. කාර්ය සාධන දර්ශක

## 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 90% - 100% | 75% - 89% | 50% - 74% | |
| 2025 දී සමුද්‍ර මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 313,000 දක්වා වැඩි කිරීම | √ | | | 308,205 / 313,000 X 100 = 98.46 % |
| 2025 දී දේශීය ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 102,000 දක්වා වැඩිකිරීම | | | √ | 55,985 / 102,000 X 100 = 54.88% |
| එක් දිනක් තුළ ග්‍රෑම් 34 දක්වා ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම | √ | | | 33.9 / 34 X 100 = 99.70% |

# 5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්ක / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50%- 74% | 75%- 100% | |
| තිරසාරසංවර්ධනඉලක්කය14 (තිරසර සංවර්ධනය පිණිස සාගර, මුහුදු හා සාගර සම්පත් සංරක්ෂණය හා ධරණීය භාවිතය.) | 2025 දී සමුද්‍ර මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො 313,000 කි. | මෙ.ටො 308,205 | | | √ | 308,205 / 313,000 X 100 = 98.46% |
| | 2025 දී මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො 102,000 කි | මෙ.ටො 55,985 | | √ | | 55,985 / 102,000 X 100 = 54.88% |
| | 2025 දී ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 39 දක්වා වැඩි කිරීම. | දිනකට ග්‍රෑම් 33.9 | | | √ | 33.9 / 34 X 100 = 99.70% |
| තිරසර සංවර්ධන ඉලක්ක 12 (තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවක් සහතික කිරීම.) | මත්ස්‍ය අපනයන ආදායම වැඩිකිරීම 2025 වසරේදී ඇ.ඩො.මි. 303 දක්වා වැඩි කිරීම | ඇ.ඩො.මි. 307.9 උපයා ගෙන ඇත | | | √ | 307.9 / 303 X 100 = 101.61% |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

14.7.1, ඉලක්කය, 2030 වන විට ධීවර, ජල ජීවී වගාව සහ සංචාරක කර්මාන්තයේ තිරසාර කළමනාකරණය තුළින් සාගර සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීමෙන් ආර්ථික ප්‍රතිලාභ වැඩිකර ගැනීම.
දර්ශකය14.7.1 : කුඩා රාජ්‍යයන්, අඩු සංවර්ධිත රටවල් සහ සියලුම රටවල දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ධීවර කටයුතු (ප්‍රොක්සි දර්ශකය)

| දර්ශකය | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|
| අගය එකතු කරන ලද කරදිය මත්ස්‍ය ධීවර කර්මාන්තය (%) | 1.0 | 1.1 | 0.9 | 0.9 | 1.0 | 0.9 | 0.8 |
| අගය එකතු කරන ලද මිරිදිය ධීවර හා ජලජීවී වගාව (%) | 0.2 | 0.2 | 0.2 | 0.2 | 0.2 | 0.2 | 0.1 |
| ධීවර හා ජලජීවී වගාවෙහි දළ දේශීය නිෂ්පාදිතය (GDP) | 1.2 | 1.3 | 1.1 | 1.1 | 1.2 | 1.1 | 0.9 |

*මූලාශ්‍රය: සංඛ්‍යාලේඛන අංශය, ධීවර අමාත්‍යාංශය – 2020-2021 / තිරසර සංවර්ධන සභාව*

**ඉලක්ක 14.b, කුඩා පරිමාණ ශිල්පීය ධීවරයින් සඳහා සමුද්‍ර සම්පත් සහ වෙළඳපල වෙත ප්‍රවේශය ලබාදීම.**
ඉලක්ක 14.b.1, නීතිමය/ නියාමන/ ප්‍රතිපත්තිමය/ ආයතනික රාමු ප්‍රස්ථාරයක යෙදවුම් ප්‍රමාණය හඳුනා ගැනීම සහ කුඩා පරිමාණ ධීවර කර්මාන්තය සඳහා ප්‍රවේශ අයිතීන් ආරක්ෂා කිරීම.

| | 2022 | 2023 | ඉලක්කගත 2030 |
|---|---|---|---|
| 1. විශේෂයෙන් කුඩා පරිමාණ ධීවර ක්ෂේත්‍ර ඉලක්ක කරගත් හෝ ඊට අදාළව නීති, රෙගුලාසි, ප්‍රතිපත්ති සැලසුම් හෝ උපායමාර්ග පැවතීම. | 40% | 40% | 100% |
| 1. SSF මාර්ගෝපදේශය ක්‍රියාවට නැංවීම සඳහා දැනට ක්‍රියාත්මක විශේෂිත මුලපිරීම් | 30% | 30% | 100% |
| කුඩා පරිමාණ ධීවරයින් සහ මත්ස්‍ය කම්කරුවන් කුඩාපරිමාණ ධීවර කර්මාන්තය සඳහා කළමනාකරණ සැලසුම් සංවර්ධන තීරණ ගැනීමේ ක්‍රියාවලිය ආරම්භකිරීමටදායක වන යාන්ත්‍රණයක් පැවතීම. | 30% | 35% | 100% |

*මූලාශ්‍රය: ධීවර දෙපාර්තමේන්තුව / තිරසර සංවර්ධන සභාව*

ඉලක්ක 14.6- 2023 වනවිට අධි ධාරිතාවට සහ අධික ලෙස මසුන් ඇල්ලීමට දායක වන ඇතැම් ආකාරයේ ධීවර සහනාධාර තහනම් කිරීම, නීතිවිරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ මසුන් ඇල්ලීමට දායකවන සහනාධාර ඉවත්කිරීම සහ එවැනි නව සහනාධාර හඳුන්වාදීමෙන් වැළකීම, ලෝක වෙළඳ සංවිධානයේ ධීවර සහනාධාර සාකච්ඡාවල ඌන සංවර්ධිත රටවල් සංවර්ධනය සඳහා සුදුසු සහ ඵලදායී විශේෂ සහ අවකල්‍ය ක්‍රමවේද පිළිබඳව සාකච්ඡාව අනිවාර්ය අංගයක් විය යුතු බව හඳුනා ගැනීම.

14.6.1 දර්ශක- නීතිවිරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ මසුන් ඇල්ලීමට එරෙහිව සටන් කිරීම අරමුණු කරගත් ජාත්‍යන්තර උපකරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාණය (දර්ශකය)
ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය පිළිබඳ ඉන්දියානු සාගර ටූනා කොමිසම විසින් අදාළ නීති සහ ගිවිසුම්වලට අනුකූල වීමේ අනුපාතය

| වසර | අනුකූලතා අනුපාතය |
|---|---|
| 2010 | 5% |
| 2011 | 18% |
| 2012 | 47% |
| 2013 | 51% |
| 2014 | 60% |
| 2015 | 74% |
| 2016 | 77% |
| 2017 | 82% |
| 2018 | 87% |
| 2019 | 90% |
| 2020 | 86% |
| 2021 | 76% |
| 2022 | 83% |
| 2023 | 78% |

### 5.2.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමට ඇති අභියෝග

1. මෙම කාල පරාසය තුලදී ඇතිවූ ඉන්ධන හිඟ තත්වය, ඉන්ධන මිල ඉහළ යාම,ශ්‍රම වියදම ඉහළ යාම හා අයිස් වැනි යෙදවුම් අමුද්‍රව්‍ය වල මිල ඉහළ යාම, ධීවර දැල් ආදී ධීවර ආම්පන්න මිල ඉහළ යාම හේතුවෙන් ධීවරයින් මත්ස්‍ය කර්මාන්තයට දක්වන රුචිකත්වය අඩුවීම.

2. වෙරළබඩ සම්පත් බොහොමයක් විද්‍යාත්මක සාක්ෂි නොමැතිව දුර්වල ලෙස කළමනාකරණය කර ඇත.ඇතැම් අවස්ථා වල සම්පත් භාවිත කරන්නන් දුර්වල ලෙස අධීක්ෂණය කිරීම තුළින් සම්පත් අධික ලෙස සූරාකෑම සහ විනාශ වීම සිදු වේ.එබැවින් කළමනාකරණය කරන්නන්ගේ සහ පරිශීලනය කරන්නන්ගේ සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ ආකල්ප වර්ධනය කළ යුතුය. මීට අමතරව පවත්නා නීතිය බලාත්මක කිරීමට බලාත්මක කිරීමේ නිලධාරීන්ට නිසි දැනුම හෝ පහසුකම් ලබා දීම අවශ්‍යව ඇත.

3. ධිවර හා සාගර අංශ සම්බන්ධ නවීන පර්යේෂණ ක්‍රම පිළිබඳ දැනුම ලබා ගැනීමට තාක්ෂණික හා මූල්‍යමය බාධා හේතු වී ඇත. සාමාන්‍ය ජනතාව අතර සමුද්‍ර පරිසර පද්ධති වල වටිනාකම පිළිබඳ දුර්වල දැනුවත්භාවය ඒවා විනාශ වීමට හේතු වේ. විවිධ ආයතන අතර කාර්යභාරයන් එකිනෙක අතපසු වී පැවතීම තුළ අවසානයේ කිසිවෙකු වගකීම භාර නොගනී. ශ්‍රී ලංකාවේ සාගර හා වෙරළබඩ සම්පත් කළමනාකරණය සඳහා ආයතන අතර ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් නොමැතිවීම බරපතල කාරණයකි.

4. නීති විරෝධී හා හානිදායක පරිදි මසුන් ඇල්ලීමේ අවදානමක් පැවතීම.

5. ධීවර කර්මාන්තය නැවත ප්‍රතිෂ්ඨාපනයෙහි දුර්වලතා.

6. කලමනාකරණය සහ මත්ස්‍ය වෙළඳාම සඳහා වන අන්තර්ජාතික අවශ්‍යතා සපුරා ගැනීමේ ගැටළු.

7. ධීවර ජනතාවගේ ධීවර කටයුතු වල අඛණ්ඩ තිරසාර භාවය පිළිබඳ අවිනිශ්චිතතාව

8. සම්පත් අධික ලෙස උකහා ගැනීම සහ විනාශවීම.

## 6. මානව සම්පත් පැතිකඩ

### 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය (2025.12.31 වන දිනට)

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/(අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 29 | 21 | 08 |
| තෘතීයික | 04 | 02 | 02 |
| ද්විතියික | 150 | 93 | 57 |
| ප්‍රාථමික | 39 | 28 | 11 |

6.2. ****ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය.**

පවත්නා පුරප්පාඩු නොතකා, වර්තමාන කාර්ය මණ්ඩලයට කාර්යක්ෂමව රාජකාරි ඉටුකිරීමට හැකිවී තිබේ. සේවාව තවුරටත් වැඩිදියුණු කිරීම සඳහා පුරප්පාඩු පුරවාලීමට අදාල බලධාරීන්ට ඉල්ලීම් කර ඇත.

### 6.3. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසට හනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය(Rs.) | | වැඩසටහ නේ ස්වභාවය (දේශීය/වි දේශීය) | නිමැවුම /ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ඉඩම් රාජකාරි පිළිබඳ පුහුණු වැඩසටහන | 51 | දින 02 | 91,230 | | දේශීය | පුහුණු විෂය ක්ෂේත්‍ර වල සමස්ත ඵලදායි තාව ඉහළ නංවා ඇත |
| Government Pay System පිළිබඳ පුහුණු වැඩසටහන 1 | 24 | දින 01 | - | | දේශීය | |
| Government Pay System පිළිබඳ පුහුණු වැඩසටහන 2 | 28 | දින 01 | - | | දේශීය | |
| Government Payroll System – Metropolitan Campus | 02 | දින 03 | 36,000 | | දේශීය | |
| Diploma in Public Procurement & Contract Administration 2025 (4th Batch) | 01 | අවුරුදු 01 | 75,000 | | දේශීය | |
| ඡායාරූපකරණය සහ වීඩියෝකරණය පුහුණු පාඨමාලාව | 02 | දින 01 | - | | දේශීය | |
| කළමණාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය 2023 යටතේ බඳවාගත්, 2025 වර්ෂයේ පත්වීම් ලද නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | 03 | දින 05 | - | | දේශීය | |
| ඵලදායී රාජ්‍ය සේවය පිළිබඳ පුහුණු වැඩසටහන | 56 | දින 01 | 57,455 | | දේශීය | |
| ලිපිගොනු කළමනාකරණය හා කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන | 51 | දින 01 | 52,500 | | දේශීය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| නව ප්‍රසම්පාදන මාරගෝපදේශ සංග්‍රහය පිළිබඳ පුහුණු වැඩසටහන | 55 | දින 01 | 55,560 | | දේශීය | |
| රාජ්‍ය නිලධාරීන් උදෙසා සංඥා භාෂා සහතික පත්‍ර පාඨමාලාවක් ස්ථාපනය කිරීම | 02 | දින 24 | - | | දේශීය | |
| අවදිනම් කලමනාකරණ පුහුණු වැඩමුළුව | 40 | දින 01 | 63,280 | | දේශීය | |
| විශ්‍රාම වැටුප් සැකසීම හා වැටුප් පරිවර්ථන පිළිබඳ පුහුණු වැඩසටහන | 50 | දින 01 | 43,320 | | දේශීය | |
| KPI සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 34 | දින 01 | - | | දේශීය | |
| රාජකාරී සමාලෝචනය පිළිබඳ පුහුණු වැඩසටහන | 22 | දින 01 | 5,200 | | දේශීය | |
| AI තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන -1 | 23 | දින 01 | 4,400 | | දේශීය | |
| ප්‍රසම්පාදන ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන | 53 | දින 01 | 61,923 | | දේශීය | |
| AI තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන -2 | 49 | දින 01 | 12,480 | | දේශීය | |
| රියදුරන් සඳහා එක් දින වැඩමුළුව - ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | 03 | දින 01 | 18,000 | | දේශීය | |
| 2025.10.01 පත්වීම් ලද නවක කලමනාකරණ සේවා නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | 21 | දින 01 | 3,389 | | දේශීය | |
| ලංසු ඇගයීම පිළිබඳ පුහුණු වැඩසටහන - ප්‍රාග් ආයතනය | 04 | දින 01 | 50,000 | | දේශීය | |
| Capacity Building Workshops on Digital Transformation | **04** | දින 03 | - | | දේශීය | |
| ආයතනික ඵලදායීතාවය වැඩිකිරීම පිළිබඳ හා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 37 | දින 01 | 43,555 | | දේශීය | |
| බැහැරගත පුහුණු වැඩසටහන | 69 | දින 01 | 340,032 | | දේශීය | |
| මාර්ග නීති, වාහන භාවිතා හා පොදු මහජන ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 20 | දින 01 | 72,340 | | දේශීය | |

# 7. අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **01** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නැත | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | | | |
| 1.6 | වෙනත් | | | |
| **02** | **පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම ( මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2,2 | පුද්ගල පඩිනඩි ලේඛණ/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2,3 | විගණන විමසුම් ලේඛණය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම ( මු.රෙ 135)** | | | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය බලතල පවරා තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.2 | මූල්‍ය බලතල පවරා තිබීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **04** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිතදිනටඉදිරිපත්කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **05** | **විගණන විමසුම** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **06** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. (134) (2) DMA/1-2019 අනුව, වසරආරම්භයේදීවිගණකාධිපතිවරයාසමඟසා කච්ඡාකිරීමෙන්අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **07** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA/1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **08** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.සම්බන්ධිකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | . | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම | අනුකූල වේ | | |
| **09** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | කාර්මික වාර්තා හා තක්සේරු වාර්තා ප්‍රමාද වීම | වාර්තා කඩිනමින් ලබා ගැනීමට ක්‍රියාත්මක වීම |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල නොවේ | ඉන්ධන සඳහා වන ප්‍රතිපාදන කලමනාකරණය කිරීම සඳහා ඉන්ධන දහනය පරීක්ෂා කිරීම ප්‍රමාද වූ අතර මෙම වර්ෂයේ පළමු කාර්තුව තුළ අවසන් කිරීමට කටයුතු කරමි. | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අදාල නැත | කල්බදු කාල සීමාවෙන් අනතුරුව අයිතිය පැවරෙන පරිදි වාහන ලබාගෙන නොමැත | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | නිරවුල් කර තිබීම | | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිනුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ (19.1 හි සඳහන්) 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩදටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. FLS/B/MF/2/25/01 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2026 මැයි 26 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

ශීර්ෂය 151 - ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 151 - ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2025 අංක 19 දරන ජාතික විගණන (සංශෝධන) පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරන වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර ධීවර,ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින් මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් වූ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මූල්‍ය නොවන වත්කම් වර්ග 05 ක අවසාන ශේෂය 2025 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය සමඟ සමාන විය යුතු වුවත් එම ශේෂයන් අතර රු.2,774,885 ක වෙනසක් පැවතුණි.

(ආ) SA 82 සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමට (Harbours dams and other water works communication line, power line and pipelines) අදාළව 2025 වර්ෂයේ අත්පත් කරගැනීම් ලෙස රු.763,822,208 ක් සඳහන් කර තිබූ අතර SA 10 වියදම් සාරාංශ ආකෘතියෙහි 2025 වර්ෂයේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමට අදාළව මූලධන වියදම ලෙස රු.1,711,415,069 ක් දක්වා තිබීමෙන් රු.947,592,860 ක වෙනසක් පැවතුණි.

(ඇ) SA 82 සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ 2025 වර්ෂයේ අත්පත් කරගැනීම ලෙස එකතුව රු.1,503,591,836 ක් දක්වා තිබූ අතර එයට අදාළ උපලේඛනයක් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

(ඈ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද සමාලෝචිත වර්ෂයේ ඉවත් කිරීමේ ලැයිස්තුව අනුව වත්කම් ඉවත් කිරීම්වල වටිනාකම රු.77,037,792 ක් ලෙස දක්වා තිබුණද සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය (SA 82) ප්‍රකාරව 2025 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ඉවත්කිරීම් (Disposal) අගයක් නොමැති බව දක්වා තිබුණි. ඒ අනුව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති දේපල පිරියත උපකරණ වල වටිනාකම නිවැරදි නොවිය.

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපකරණ පිළිබඳ ලේඛනය විධිමත් පරිදි පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) පොත් නාමාවලිය | මුදල් රෙගුලාසි 454(3) | නව නීති වාර්තා, ව්‍යවස්ථාදායක පනත්, පාර්ලිමේන්තු රෙගුලාසි, අමාත්‍යාංශ වාර්තා, වාර්ෂික ප්‍රකාශන හා අනෙකුත් විවිධ ප්‍රකාශන ආදී පොත් සඳහා ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) වැය විෂයයන් 05ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් සහ මුදල් රෙගුලාසි 66/69 මාරුකිරීම් මගින් එකතුව රු.149,878,078 ක අතිරේක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද 2025 දෙසැම්බර් 31 දින වන විටත් ඉන් එකතුව රු.87,686,986 ක් ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 04 ක් සඳහා සලසාගෙන තිබූ ප්‍රතිපාදන වලින් රු.12,110,000 ක් වැය නොකර වර්ෂය අවසානය වන විටත් එලෙසම ඉතිරිව පැවතුණි.

(ඇ) වැය විෂයය 19 ක් සඳහා වෙන්කර තිබූ එකතුව රු.3,221,190,000 ක ශුද්ධ ප්‍රතිපාදන මුදලින් සමාලෝචිත වර්ෂය අවසානයේ දී එකතුව රු.1,911,398,969 ක් ඉතිරිව පැවති අතර එකී වැය විෂයයන්ගේ ඉතිරිය සියයට 51 සිට සියයට 99 දක්වා පරාසයක පැවතුණි.

(ඈ) වැය විෂයයන් 08 සඳහා මූලික ඇස්තමේන්තුව මගින් අධි ප්‍රතිපාදනයක් සලසා ගැනීම හේතුවෙන් එකී වැය විෂයයන්ගෙන් වෙනත් වැය විෂයයන් වෙත මුදල් රෙගුලාසි 66 මගින් ප්‍රතිපාදන මාරු කිරීමෙන් පසුව ද ඉතිරිවීම් සියයට 13 සිට සියයට 90 දක්වා පරාසයක පැවතුණි.

(ඉ) වැය විෂයයන් 12 ක් සඳහා ඌන ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් මුදල් රෙගුලාසි 66 මගින් සියයට 10 සිට සියයට 640 දක්වා අතිරේක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි.

### 3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලටයොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 104(1) | නාරාහේන්පිට, මුහන්දිරම් ඊ.බී.දාබරේ මාවතේ අංක 18/146 B දරන ස්ථානයේ පිහිටා තිබූ ධීවර අමාත්‍යාංශයේ ලේකම් තනතුර සඳහා වෙන්කර තිබූ නිල නිවස සඳහා දී තිබූ සියලුම රජයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අස්ථානගත වී තිබෙන බව 2023 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් වාර්තා කර තිබුණු අතර ගොඩනැගිල්ලේ සවිකර තිබූ දොර ජනෙල් අගුළු හා ගොඩනැගිල්ලේ සවිකිරීම්ද ගලවාගෙන ගොස් තිබුණි. ඒ අනුව මෙම නිල නිවස තුල තිබුණු රජයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සියල්ලම අස්ථානගත වී තිබීම සහ රජයේ ගොඩනැගිලිවලට හානි සිදු වී තිබීම නිසා රජයට සිදුවී තිබෙන රු.1,808,262ක පාඩුව පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඊට වගකිවයුතු පාර්ශව හඳුනාගෙන පාඩුව අයකරගෙන නොතිබුණි. |
| (ආ) 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ආයතනයේ සියලුම සංචිත වාහන සඳහා රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර නොතිබුණි. |
| (ඇ) 2015 ජූලි 23 දිනැති අංක 07/2015 දරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව චක්‍රලේඛයේ 8(vii) වන වගන්තිය | එක් එක් මාසයේ දායක මුදල්, ඊළඟ මාසයේ 10 වන දිනට පෙර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද, ධීවර අමාත්‍යතුමාගේ හා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයෙන් අයකරගෙන තිබූ එකතුව රු.90,420 ක් වූ රාජ්‍ය සේවා අර්ථසාධක දායකය අරමුදලට ප්‍රේෂණය නොකර 6000-0-018-045 දරන ව්‍යාවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවාගැනීම් තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 වගන්තිය | අමාත්‍යාංශය සතු වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ඉ) | 2021 දෙසැම්බර් 09 දිනැති අංක 05/2021 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 වගන්තිය | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අනුව සෑම මූල්‍ය නොවන වත්කමක්ම සෑම වර්ෂ 5 කට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු බව දක්වා තිබුණ ද මෙම අමාත්‍යාංශයේ වාහන සම්බන්ධයෙන් එකී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එසේම 2024 අප්‍රේල් 30 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2024 හි 1 ඡේදය මඟින් ද 2024 මැයි 15 දින සිට වාහන වටිනාකම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය දක්වා ඇතත් ඒ පරිදි ද කටයුතු කර නොතිබුණි. |

### 3.3 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බි ගිණුම

(අ) අමාත්‍යාංශයේ සේවයේ නියුතුව සිට 2025 වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් ආපදා ණය, දේපල ණය, උත්සව හා විශේෂ අත්තිකාරම් වශයෙන් එකතුව රු.332,326 ක් 2026 අප්‍රේල් 30 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයේ රියදුරු තනතුරේ සේවයේ යෙදෙමින් සිට 2015 වර්ෂයේ සේවය අතහැර ගොස් තිබුණු අයකුගෙන් අයවිය යුතු ආපදා හා දේපල ණය එකතුව රු.113,610 ක් 2025 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

### 3.4 තැන්පතු ගිණුම් ශේෂ

පොදු තැන්පත් ගිණුම්වල කාල විශ්ලේෂණය අනුව වර්ෂ 05 ඉක්මවූ තැන්පතුවල වටිනාකම රු.30,980,123 ක්ද වර්ෂ 02 ඉක්මවූ තැන්පතුවල වටිනාකම රු.332,894,988 ක්ද විය. ඒ අනුව වර්ෂ 02 ඉක්මවූ රාජ්‍ය ආදායමට ගත හැකි රු.11,081,082 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලැසුම් කිරීම

(අ) අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වැය විෂයයන් සඳහා වෙන් කරන ලද ශුද්ධ ප්‍රතිපාදනය රු.5,278,536,756 ක්වූ අතර වියදම් රු.2,771,827,957 ක් විය. ඒ අනුව උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදනය,මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 53 ක් විය.

(i) මයිලඩි ධීවර වරාය සංවර්ධන කාර්යය සඳහා වැය විෂයය 151-2-3-68-2104 යටතේ රු.මිලියන 200 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සලසා දී ඇතත් සී-නෝර් පදනම වෙත සෘජු කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ප්‍රමාදවීම සහ කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා මිලගණන් සාකච්ඡා කිරීමේ දී සිදු වූ ප්‍රමාදය හේතුවෙන් රු.198,708,905 ක් ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර එය ලබා දී තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 99 ක් විය.

(ii) ගන්දර ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වැය විෂයය 151-2-3-71-2104 යටතේ රු.මිලියන 3,150 ක් මූලික ඇස්තමේන්තුවෙන් සපයා දී තිබූ අතර එයින් රු.මිලියන 891 ක් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන් වෙත මාරු කිරීමෙන් පසුව රු.මිලියන 2,259 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,167 ක් එනම් සියයට 51 ක් ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාදවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(iii) මාවැල්ල නැංගුරම්පොළ ඉදිකිරීම සඳහා වැය විෂයය 151-2-3-75-2104 යටතේ රු.මිලියන 20 ක ශුද්ධ ප්‍රතිපාදනය මත ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇතත් කොන්ත්‍රාත්කරුවන් ලංසු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමට නොහැකිවීම මත මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(iv) වැය විෂයය අංක 151-2-3-81-2104 යටතේ උතුරු පළාතේ ධීවර ප්‍රජාව සංවර්ධනය (ගොඩනැගිලි හා ඉදිකිරීම්) සඳහා රු.මිලියන 485 ක ප්‍රතිපාදන වෙන්කර ඉන් රු.මිලියන 230 ක් සී-නෝර් පදනම වෙත සෘජු කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කාලයක් ගතවීම මත ඉතිරි වී තිබූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 47 ක් වී තිබුණි.

(ඊ) රැකව නැංගුරම්පොළ ඉදිකිරීමේ කාර්යය සඳහා වැය විෂයය 151-2-3-74-2104-0/11 යටතේ මූලික ඇස්තමේන්තුවෙන් රු.10,000,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණද සැලසුම්කළ කාර්යය ඉටු වී නොතිබුණි.

### 4.1.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

ධීවර වරායයන් සහ නැංගුරම්පල ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් වූ 2013 ජූලි 04 දිනැති අංක 1/5/1/1/අමා.සං/2013-09 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබා දී තිබූ අනුමැතියට අනුව ගාල්ල දිස්ත්‍රික්කයට අයත් කයිකාවල මුහුදු ප්‍රදේශයේ නැංගුරම්පලක් ඉදිකිරීම වෙනුවෙන් පැකේජ 01 සහ 02 වශයෙන් ලංසු කැඳවීම් සිදුකර පැකේජ 01 රු.132,602,410 ක කොන්ත්‍රාත් වටිනාකමට සහ පැකේජ 02 රු.113,198,400 ක කොන්ත්‍රාත්

(ආ) මුදල් රෙගුලාසි 208 ප්‍රකාරව ධීවර ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත කොළඹ වරාය පුළුල් කිරීම හේතුවෙන් ධීවර කර්මාන්තයට සිදු වූ බලපෑම අවම කිරීම යටතේ ලුනාව ධීවර තොටුපළ ප්‍රතිසංස්කරණය, වින සමූහාණ්ඩුව මගින් ලබා දුන් පෙරසවි නිවාස සැකසීම, එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම හේතුවෙන් ධීවර ක්ෂේත්‍රය සඳහා වන්දි ගෙවීමේ පරිපාලන කටයුතු වෙනුවෙන් නිලධාරීන්ට දීමනා ගෙවීම යන අරමුණු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.83,760,756 ක ශුද්ධ ප්‍රතිපාදන ලබා දී ඇතත් ඒවා උපයෝගී කරගැනීම සියයට 33, සියයට 39 සහ සියයට 57 ක තරම් අඩු මට්ටමක පැවතුණි.

(ඇ) ලංකා ධීවර සංස්ථාවේ ශීතාගාර පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ අලුත්වැඩියා කිරීම වෙනුවෙන් වැය විෂයය 151-2-3-92-2002 යටතේ රු.86,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනයක් ලබා දී තිබූ අතර ඉන් රු.71,779,356 ක් එනම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 83 ක් ඉතිරි වී තිබුණි. එම කොන්ත්‍රාත්තුව සීමාසහිත සී-නෝර් පදනම වෙත ප්‍රදානය කර තිබූ අතර කොන්ත්‍රාත් පිරිනැමීමේ ලේඛනයට අදාළව දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ලියකියවිලි ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් දින 14 ක් ඇතුළත ශීතාගාර පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය උපකරණ සහ යන්ත්‍රෝපකරණ සමඟ අදාළ වැඩබිමට ඇතුලුවීමට සීමාසහිත සී-නෝර් පදනම අපොහොසත්වීම වැනි හේතු දක්වා තිබුණි. ඒ අනුව උක්ත ව්‍යාපෘතිය සම්පූර්ණ කරගැනීම කෙරෙහි නිසි අධීක්ෂණයක් හෝ පසුවිපරම් කිරීමක් සිදුකර නොතිබුණි.

(ඈ) අමාත්‍යාංශයේ කලපු සංවර්ධනය සහ සංරක්ෂණ ව්‍යාපෘතිය සඳහා වැය විෂයය අංක 151-2-3-64-2104 යටතේ රු.100,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනයක් ආරුගම්බේ කලපුව පිරිසිදු කිරීම සඳහා වෙන්කර තිබූ අතර එම මුදලින් රු.64,801,971 ක් හෙවත් සියයට 35 ක ඉතිරිවීම සඳහා හේතු වශයෙන් ආරුගම්බේ කලපුවේ ඇති අපද්‍රව්‍ය සුදුසු ස්ථානයකට බැහැර කිරීමට සුදුසු ස්ථානයක් සොයා ගැනීමටත් ඒ සඳහා අපද්‍රව්‍ය බැහැර කිරීමට අනුමැතිය ලබාගැනීමටත් අවශ්‍ය වූ එබැවින්, ස්ථානයක් තෝරා ගත්ත ද ඒ සඳහා අනුමැතිය ලබාදීම ප්‍රමාදවීම නිසා අදාළ ප්‍රතිපාදන නියමිත පරිදි වියදම් කිරීමට නොහැකි වූ බව දක්වා තිබුණි. ඒ හේතුවෙන් උක්ත ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රගතිය ළඟාකර ගැනීමට නොහැකිව පැවතුණි.

(ඉ) 2025 වර්ෂයේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති 08 ක් වෙනුවෙන් ප්‍රතිපාදන රු.මිලියන 3,544 ක් වෙන්කර දී එම ව්‍යාපෘතිවල ප්‍රගතිය පරීක්ෂා කිරීමේ දී ඒවා අවම මට්ටමක පවතින බවත් ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ නිසි අධීක්ෂණයක් නොමැතිවීමත් විය හැකි අනපේක්ෂිත සිද්ධීන්වලට ඉඩ දෙමින් ව්‍යාපෘති ප්‍රගතිය නියමිත කාල රාමුවක් තුළ ලබා කරගැනීම සඳහා වන සැලසුම්, සුදුසු පරිදි පුරෝකථනය කර නොමැති බවත් විගණනයේ දී නිරීක්ෂණය විය.

වටිනාකමට වසරක් ඇතුළත ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව නිම කිරීම මත පැකේජ 02 සඳහාම 2014 සැප්තැම්බර් 14 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් සමාගම විසින් පැකේජ 02 සඳහාම ඉදිකිරීම් වැඩ ආරම්භ කර තිබුණු අතර අමාත්‍යාංශය විසින් 2014 සැප්තැම්බර් 29 දින රු.49,160,162 ක වැඩ ආරම්භ කිරිමේ අත්තිකාරම් මුදල් පැකේජ 02 සඳහාම ගෙවීම් කර තිබුණි. කෙසේ වෙතත් මෙම කොන්ත්‍රාත්තු සඳහා ඉදිකිරීම් බලපත්‍රයක් නොතිබීම නිසා ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමත් සමඟම නවතා දැමීමට සිදුවී තිබුණු අතර අත්තිකාරම් මුදල ආපසු අයකරගෙන නොතිබුණි.

## 4.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාරගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරිම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන් ද, රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අය ද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් ධීවර අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් ඇප තැන්පත් කර නොතිබුණි.

## 4.3 පාඩු හා හානි

(අ) වර්ෂය තුළ අයකර ගැනිම / කපා හැරිම අත්හැරීම් සහ තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත් හැරීමට ඇති පාඩු පැවති නමුත් ඒවා මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම අංක (i) හි ඇතුළත් කර නොතිබුණි.

(ආ) ධීවර අමාත්‍යාංශය පිහිටා ඇති ගොඩනැගිල්ලෙහි අතිරේක මහල් තුනක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු කරගෙන යාමේ දී 2018 දෙසැම්බර් 02 දින එහි කොන්ත්‍රාත්කරුගේ නොසැලකිල්ල හේතුවෙන් වැසි ජලය කාන්දුවීම හේතුවෙන් හය වැනි මහල හා පස් වැනි මහලෙහි භාණ්ඩ හා දේපලවලට සිදු වූ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 යටතේ කරන ලද පරීක්ෂණ වාර්තාව මඟින් ස්වාභාවික හේතුවක් මත සිදු වූ හානියක් නොවන බැවින් ද, කොන්ත්‍රාත්කරු එය වළක්වා ගැනීමට වැඩපිළිවෙලක් යොදවා නොතිබුණු බැවින් ද එය මුදල් රෙගුලාසි 103 යටතට වැටෙන හානියක් බව තීරණය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයට සිදු වූ රු.610,996කට අධික හානි පූරණයට අදාළ මුළු වියදම කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කිරීම සුදුසු බව එම වාර්තාවෙන් නිර්දේශ කර තිබුණු නමුත් මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) 2025 මැයි මස 16 දින හෝ ඊට ආසන්න දිනයට දෙවන මහලේ ප්‍රධාන ගණකාධිකාරිගේ කාර්යාලයේ වායු සමීකරණ යන්ත්‍රවල Out door කොටස් සොරකම් කර තිබුණු අතර ඒ පිළිබඳව මුදල් රෙගුලාසි 104(3) යටතේ සිදුකරනු ලබන පරීක්ෂණ වාර්තාව 2026 මාර්තු මාසය වන විටත් නිකුත් කර නොතිබුණි.

### 4.4 අනාර්ථික ගනුදෙනු

ආරක්ෂක සේවා සැපයීමේ දී ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් ධීවර අමාත්‍යාංශය වෙත ඉන්වොයිස් පත් නිකුත් කරනු අතර ඒ සඳහා මුදල් ගෙවීමේ දී ඉන්වොයිස්පතේ සඳහන් මුදලම නොගෙවීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට ගෙවීමට ඇති හිඟ මුදල රු.62.770,369 දක්වා වර්ධනය වී තිබුණි.

### 4.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2025 වර්ෂයේ මාර්තු මස නිකුත් කරන ලද එක් විගණන විමසුමක් සඳහා මෙම වාර්තාවේ දින තෙක්ම පිළිතුරු ලබා නොතිබුණි.

### 4.6 කළමනාකරණ දුර්වලතා

(අ) 2023 දෙසැම්බර් 06 වන දින සේවය හැරගිය සංවර්ධන නිලධාරියකු වෙත වැඩිපුර ගෙවා ඇති වැටුප් හා දීමනා රු.71,297 ක් 2026 මැයි 21 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) අමාත්‍යාංශයේ 2025 වර්ෂයේ ප්‍රතිශෝධිත ඇස්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තින් මත පිහිටා ධීවර විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම නිසි පරිදි ඉටුකර නොතිබුණි. එනම් 2025 වර්ෂයේ ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව මඟින් පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා පිළිවෙලින් රු.1.107.000.000 ක්වූ ප්‍රතිපාදන ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) වෙතද, රු.830.000.000 ක්වූ ප්‍රතිපාදන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) වෙතද හා රු.350.000.000 ක්වූ ප්‍රතිපාදන ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC) වෙතද වෙන්කර අනතුරුව පරිපූරක ඇස්තමේන්තු මඟින් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පුද්ගල පඩිනඩි සඳහා රු.46.284.000 ක්ද ලංකා ධීවර නීතිගත සංස්ථාව වෙත පුද්ගල පඩිනඩි සඳහා රු.88.000.000 ක්ද වෙන්කර දී ඇතත් ඒවා වියදම් කළ ආකාරය පිළිබඳ විස්තර ඇතුළත් වියදම් වාර්තා, තොරතුරු හා එම එක් එක් ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ වෙන වෙනම හඳුනාගත හැකි පරිදි පිළියෙල කළ තොරතුරු විගණනයට

ඉදිරිපත් නොකිරීම නිසා රු.2,460,902,429 ක වියදම්වල නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේ තහවුරු කරගැනීමට නොහැකි විය.

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ තනතුරු 29 කට අදාළව පුරප්පාඩු 08 ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 04 කට අදාළව පුරප්පාඩු 02 ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 150 කට අදාළව පුරප්පාඩු 57 ක්ද. ප්‍රාථමික මට්ටමේ තනතුරු 39 කට අදාළව පුරප්පාඩු 11 ක් ද පැවති බව නිරීක්ෂණය විය.

(ආ) 2025 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ තත්‍ය කාර්යය මණ්ඩලය තුළ අන්තර්ගත වී ඇති වැටුප් රහිත දේශීය / විදේශීය නිවාඩු මත සිටින කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව 34 ක් විය.

පී.කේ.එම්.පී.නෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට